**උත්පත්ති 1 පරිච්ඡේදයේ මුදාගැනීමේ ඉතිහාසය (මිදීමේ ඉතිහාසය)**

*අන්තිමය ආරම්භයේ සිටම ප්‍රකාශ කිරීම*

යෙසායා 46:9-10 පුරාණයේ පළමු කාරණා සිහිකරන්න. මක්නිසාද මමම දෙවියන්වහන්සේය, වෙන කෙනෙක් නැත මම දෙවියන්වහන්සේය, මා සමාන කෙනෙක් නැත. [10]මම වනාහි අන්තිමය මුල පටන්ද තවම සිද්ධනුණාදේ පුරාණයේ පටන්ද දන්වන්නාවූ: මාගේ මන්ත්‍රණ පවත්නේය කියාත් මාගේ මුළු කැමැත්ත ඉෂ්ටකරන්නෙමියි කියාත් කියන්නාවූ තැනන්වහන්සේය.

**හැඳින්වීම- උත්පත්ති 1 පරිච්ඡේදය අපට දැකිය හැක්කේ කෙසේද?**

අප බයිබලය විවෘත කරන විට අප දකින පළමු දෙය උත්පත්ති 1 පරිච්ඡේදය වේ. උත්පත්ති 1 යනු පළමු පරිච්ඡේදය මෙන්ම සමස්තයක් වශයෙන් බයිබලය හඳුන්වාදීමක් වේ. එබැවින්, ඔබ උත්පත්ති 1 පරිච්ඡේදය දෙස බලන ආකාරය අනුව සමස්ත බයිබලයම වෙනස් වේ.

උත්පත්ති 1 විවිධ ආකාර තුනකින් තේරුම් ගත හැකිය.

## 1) මැවීමේ කතා පුවත

| 1 දිනය | 2 දිනය | 3 දිනය | 4 දිනය | 5 දිනය | 6 දිනය | 7 දිනය |
|---|---|---|---|---|---|---|
| අලෝකය | ඉහලින් වූ ජලය | භූමිය | ඉර තරු | කුරුල්ලන් | මනුෂ්‍යයා | විවේකය |
| | පහලින් වූ ජලය | මුහුද | සඳ | මත්ස්‍යයෝ | මෘගයන් | |

**මෙය නිරීක්ෂණය කරන විට බොහෝ ප්‍රශ්න මතු වේ**

- දින 7 ක් අවශ්‍ය වූයේ ඇයි? (සියල්ල තත්පර 1 කින් නිර්මාණය කළ හැකිව තිබුණේය)

- 1 වන දිනය සහ 4 වන දිනය අතර ඇති ආලෝකය වෙනස් වන්නේ කෙසේද?

- 2 වන දින සියල්ල යහපත් බව ගැන සඳහනක් නැත්තේ ඇයි?

- 4 වන දින වේලාව නිර්මාණය කරන ලද්දේ නම්, 1 වන දින සිට 3 වන දිනය දක්වා වන කාල නිර්ණායකවල ප්‍රමිතිය කුමක්ද?

- සවස් වරුව පළමුවෙන් සහ උදේ පසුව පැමිණියේ ඇයි?


**අපට පෙනෙන දෙය නම් උත්පත්ති 1 යන්නෙන් අදහස් කරන්නේ විශ්වයේ පෙනෙන සෑම දෙයක්ම නිර්මාණය කිරීමට වඩා වැඩි යමක් ඇති බවයි**

## 2) සම්පූර්ණ බයිබලයේ සම්පිණ්ඩනය

ප්‍රධාන පාලක ආබ්‍රහම් පාර්ක් මෙසේ පවසයි:

**උත්පත්ති 1 තේරුම් නොගත් නිසා, මුළු උත්පත්ති පොතම එළියට ආ අතර උත්පත්ති පොත තේරුම් නොගත් නිසා මුළු බයිබලයම එළියට පැමිණියේය**

වෙනත් වචන වලින් කිවහොත්, මෙයින් අදහස් කරන්නේ සියලු මිදීමේ ඉතිහාසයේ අර්ථය උත්පත්ති 1 තුළ අඩංගු වන බවයි.




| | **1 දිනය** | **2 දිනය** | **3 දිනය** | **4 දිනය** | **5 දිනය** | **6 දිනය** | **7 දිනය** |
|---|---|---|---|---|---|---|---|
| ***උත්:1*** | ආලෝකය<br>අන්ධකාරය | ඉහලින් වූ ජලය<br>පහලින් වූ ජලය | භූමිය<br>මුහුද | ඉර තරු<br>සඳ | පක්ෂීන්<br>මත්ස්‍යයන් | මනුෂ්‍යයා<br>මෘගයන් | **විවේකය** |
| ***උත්පත්ති*** | 4- අබෙල්<br>කායින් | 5 එනොක්<br>මනුෂ්‍යයා | 6 නෝවා<br>මනුෂ්‍යයා | 17 ඉසාක්<br>ඉෂ්මායෙල් | 25යාකෝබ්<br>ඒසව් | 37යොසෙප්<br>11 පුත්‍රයන් | |
| ***බයිබලය*** | ආදම්<br>ක්‍රි පූ 4114 | නෝවා<br>ක්‍රි පූ 3058 | ආබ්‍රහම්<br>ක්‍රිපූ 2166 | දාවිත්<br>ක්‍රිපූ 1040 | යේසුස්<br>ක්‍රි පූ 04 | | **සහස්‍රය** |

(2 පේත්‍රුස් 3:8) 1 දිනක් =අවුරුදු 1000


## 3) උත් 1 යේසුස් වහන්සේ වෙත ඉලක්කගත කරයි

යොහාන් 5:39- ලියවිලිවල සදාකාල ජීවනය ඇත්තේයයි නුඹලා සිතන බැවින් නුඹලා ඒවා සොයන්නහුය ඒවා මා ගැන සාක්ෂි දෙයි

මතෙව් 13:35 - මෙසේ වූයේ- උපමාවලින් මාගේ මුඛය අරින්නෙමි ලෝකයේ පටන්ගැන්මේ සිට සැඟවී තිබුණු කාරණා ප්‍රකාශකරන්නෙමියි අනාගතවක්තෘහු කරණකොටගෙන කියනලද කාරණා සම්පූර්ණ වන පිණිසය.

| | 1 දිනය | 2 දිනය | 3 දිනය | 4 දිනය | 5 දිනය | 6 දිනය | 7 දිනය |
|---|---|---|---|---|---|---|---|
| ***උත්:1 පටන්ගැන්මෙදී*** | ආලෝකය<br>අන්ධකාරය | ඉහලින් වු ජලය<br>පහලින් වු ජලය | භූමිය<br>මුහුද | ඉර තරු<br>සඳ | පක්ෂීන්<br>මත්ස්‍යයන් | මනුෂ්‍යයා<br>මෘගයන් | **විවේකය** |
| **යේසුස්වහන්සේ** (යොහාන් 1:1) ***පටන්ගැන්මේදී*** | යොහාන් 1:4 ජිවනයේ ආලෝකය | යොහාන් 2- ජලය→ මිදියුෂ<br><br>4:10 ජවනදායක ජලය | යොහාන් 3:3 නැවත උත්පදනය | අන්වෙසක් විමේ ආශිර්වාදය | | | මතෙව් 12:8 මනුෂ්‍ය පුත්‍රයා සබත් දවසේ ස්වාමියාය |

- **අන්වෙසක් විම( අන්‍යයාකාර විම) උත් 1 එළිදරව් කරයි**




**යේසුස්වහන්සේ අන්වෙසක් වීමේ ආශිර්වාදය අහිමි වීම නැවත ලබාගැනීම සඳහා පැමිණයේය**

යොහාන් 8:51 - සැබවක් සැබවක් නුඹලාට කියමි-යමෙක් මාගේ වචනය රක්ෂාකරන්නේ නම් ඔහු කිසිකලක මරණය දකින්නේ නැතැයි කීසේක.

යොහාන් 11-25-26 යේසුස්වහන්සේ: නැවත-නැගිටීමද ජිවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජිවත්වන්නේය. ජිවත්ව සිටින කවුරු නුමුත් මා කෙරෙහි අදහන්නේද, ඔහු කිසිකලකත් නොනසින්නේය

මතෙව් 17:3- බලව මෝසෙස්ද එලියාද උන්වහන්සේ සමග කථාකරමින් සිටිනවා ඔවුන්ට පෙනුණේය

## නව ගිවිසුමේ පාවුල්තුමා අවස්ථා 3ක අන්වෙසක් වීම ගැන අවධාරණය කරයි

1 කොරි- 15:51-52 -මෙන්න, නුඹලාට රහසක් කියමි. අපි සියල්ලෝම නොසැතපෙන්නෙමුව, නුමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින්, 52ඇසිපිය හෙළන ක්ෂණයකින්, අපි සියල්ලෝම වෙනස්කරනු ලබන්නෙමුව. මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය, එකල මළාහු නොදිරන ස්වභාවෙන් යුක්තව නැගුටුවනු ලබන්නෝය, අපිද වෙනස්කරනු ලබන්නෙමුව,

පිලිප්පි 3:21- සියලු දේ පවා තමන්ට යටත්කරන්ට පුළුවන්වූ බලය ලෙස, උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන්වහන්සේගේ තේජසේ ශරීරයට සමානවන පිණිස ඒවා වෙනස්කරනවා ඇත.

1 තෙසලොනික 4:17- එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමඟ ස්වාමීන්වහන්සේ සම්මුඛවන පි❑ස වලාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම ස්වාමීන්වහන්සේ සමඟ සිටින්නෙමුව.

## *පුදුමයට පත් කරමින් පාවුල් තුමා උත් 1 උපුටා ගනිමින් අන්වෙසක් වීම පැහදිලි කරයි*

1 කොරි- 15:41 සූර්යයාගේ තේජස එකක්ය, චන්ද්‍රයාගේ තේජස අනිකක්ය, තාරකාවන්ගේ තේජස තවත් එකක්ය❑ මක්නිසාද තේජසින් තාරකාවක් තාරකාවකට වෙනස්ය.

***අකාර 3 කින් වු මහිමය බලමු***

***4 වන දිනය - ඉරුගේ මහිමය (දෙවන පැමිණීම) අන්වෙසක් වීමේ ආශිර්වාදය***

***සඳේ හි මහිමය පලමු පැමිණීම නැවත නැගිටීමේ ආශිර්වාදය***

***තාරකාවන්ගේ මහිමය පරණ ගිවිසුම ව්‍යවස්ථාවේ ආශිර්වාද***

මතෙව් 13:43 -එකල ධර්මිෂ්ඨයෝ තමුන්ගේ පියාණන්ගේ රාජ්‍යයෙහි සූර්යයා මෙන් බබළන්නෝය. ඇසීමට කන් ඇත්තේ අසාවා.

1 කොරි- 15:39 සියලු මාංස එකාකාර මාංස නොවේ. මනුෂ්‍යයන්ගේ මාංසය එක් ආකාරයක, මෘගයන්ගේ මාංසය වෙන ආකාරයක, පක්ෂීන්ගේ මාංසය තවත් ආකාරයක, මසුන්ගේ මාංසය වෙනත් ආකාරයක.

***මත්ස්‍යයන්ගේ මාංශය - ජලයට සුදුසය***

***5වන දිනය- පක්ෂීන්ගේ මාංශය - අකාශයට සුදුසුය***

***මෘගයන්ගේ මාංශය - භූමියට සුදුසය***

***මනුෂ්‍යයන්ගේ මාංශය - කුමකටද***

*මිනිස් සිරුර වතුරේ සිටින මාළුවෙකුට වඩා මන්දගාමී ය, කුරුල්ලෙකු මෙන් පියාසර කළ නොහැක, පෘථිවියේ සතුන්ට වඩා ශක්තිමත් නොවේ. එසේනම් මිනිසා මැව්වේ ඇයි?*

***පිලිතුර 1කොරි 15:44-*** *ස්වාභාවික ශරීරයක්ව වපුරනු ලැබේ❑ ආත්මික ශරීරයක්ව නැගුටුවනු ලැබේ. ස්වභාවික ශරීරයක් තිබේ නම් ආත්මික ශරීරයක්ද තිබේ*

**මනුෂ්‍යයන්ගේ ශරිර ආකාර 2 කින් සමන්විත වේ**

***ආත්මික ශරීරය - ස්වර්ගයට සුදුසුය***

***ස්වභාවික ශරීරය- භූමියට අයිතිය***

අවසාන වශයෙන්, මිනිස් සිරුර මවා ඇත්තේ මේ පොළොවේ ජීවත් වීමට නොව, අන්වෙසක් වී ස්වර්ගයේ *සදා කාල ජීවනය සඳහා ය.*

*උත්: 1:26 -තවද දෙවියන්වහන්සේ: අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදමිහ❑ ඔව්හු මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයෙහි පක්ෂීන් කෙරෙහිද තිරිසනුන් කෙරෙහිද මුළු පොළොව කෙරෙහිද පොළොව පිට බඩගා යන සියල්ලන් කෙරෙහිද ආණ්ඩුකෙරෙත්වයි කීසේක.*

***දෙවියන්වහන්සේගේ ස්වරූපය*** ⟶ ***අපගේ ආත්මය***

***දෙවියන්වහන්සේගේ සමානත්වය*** ⟶ ***අපගේ ශරීරය***

*උත් 2:7- ස්වාමිවූ දෙවියන්වහන්සේ **භූමියේ දූවිල්ලෙන්** මනුෂ්‍යයා සාදා ඔහුගේ නාස්පුඩු තුළට ජීවනයේ හුස්ම හෙළුසේක❑ එවිට මනුෂ්‍යයා ජීවමාන ප්‍රාණයක් විය*

***භූමියේ දූවිල්ලේන්-*** - (Heb)עָפָר מִן־הָֽאֲדָמָה /apar min ha adamah/ (flour-like) fine soil

*උත් 2:19- ස්වාමිවූ දෙවියන්වහන්සේ වනයේ සියලු මෘගයන්ද ආකාශයේ සියලු පක්ෂීන්ද **භූමියෙන් සාදා** මනුෂ්‍යයා උන්ට මොන මොන නම් තබන්නේදැයි බලන පිණිස උන් ඔහු වෙතට පැමිණෙවූසේක. මනුෂ්‍යයා සියලු ජීවමාන සත්වයන්ට තැබූ නම් උන්ගේ නාමයෝ වූහ.*

***භූමිය-*** (Heb) הָֽאֲדָמָה/ha adamah/ coarse soil

## *අවසානය*

අද දින දේශනය පුරාම අපි උත්පත්ති 1 හි අඩංගු දෙවියන් වහන්සේගේ මිදීමේ ඉතිහාසය පිළිබඳ සොයා බැලුවෙමු. උත්පත්ති 1 යනු විශ්වීය අවකාශය හෝ මිනිස් ඉතිහාසය පිළිබඳ කාරණයක් පමණක් නොව, අපගෙ හදවත් වල සිදුවිය යුතු යේසුස් ක්‍රිස්තුස්ගේ ගැලවීමේ සිදුවීමක් බව අපි තේරුම් ගතිමු.

උත්පත්ති 1 හි සැබවින්ම බලාපොරොත්තු තැබිය හැකි වචනය අපට හමු වේ. සවස් විය, උදය විය ' මැවීමේ හයවෙනි දවස පුරාම මෙම වචනය දිගටම දක්නට ලැබෙන අතර, අප දේවරාජ්‍යය දෙසට ගමන් කරන විට අපගේ හදවතේ එවැනි සන්ධ්‍යාවක් ඇත. . කෙසේ වෙතත්, සවස් වරුව වෙනස් වී උදය පැමිණෙනවා මෙන්ම කරුණාකර යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින් අපගේ හදවත් තුළ සැඟවී ඇති සියලු අන්ධකාරය පරාජය වන බව විශ්වාස කරන්න. අවසාන වශයෙන්, මම බයිබලයක් කියවා අවසන් කරමි.

*සෙකරියා 14:7-**එහෙත් දවල් සහ රෑ නොවී, සවස් වේලාවට එළිය ඇත්තාවූ, ස්වාමින්වහන්සේ දන්නාවූ එක්තරා දවසක් පැමිණෙන්නේය***

මේ අයුරින්, අපගේ සියලු අන්ධකාරය පරාජය කරන සැබෑ ආලෝකය වනුයේ යේසුස් වහන්සේ පමණි. ස්වාමින් වහන්සේගේ නාමයෙන්, ඔබ සියලු අන්ධකාරය ජයගෙන නැවත රාත්‍රියක් නැති සදාකාලික විවේක ලෝකයකට ඇතුළු වීමට යේසුස් වහන්සේ මත පමණක් රඳා සිටින ආශිර්වාද ලත් ඇදහිලිවන්තයෙකු වනු ඇතැයි යාච්ඤා කරමි . ආමේන් !!